**මහ කොළඹ අප ජල කළමනාකරණ ව්‍යාපෘතිය - 2015**

-----------------------------------------------------------------

මහ කොළඹ අප ජල කළමනාකරණ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2009 දෙසැම්බර් 18 දින එළඹි අංක 2557 හා 2558 දරන ණය ගිවිසුම්වල 5 උපලේඛනයේ 27 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-------------------------------------------------------------------

මහ කොළඹ අප ජල කළමනාකරණ ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයට වර්තමානයේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කොළඹ මහනගර සභාව හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපාරයේ අරමුණු වන්නේ වැඩිදියුණු කළ මුහුදු හා ගොඩබිම ජල තත්ත්වය මඟින් මහ කොළඹ ප්‍රදේශයේ නාගරික හා උප නාගරික නිවැසියන් මිලියන 1.5 ක් සඳහා නාගරික පරිසරය හා මහජන සෞඛ්‍ය වැඩිදියුණු කිරීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස සෞඛ්‍ය හා සනීපාරක්ෂක තත්ත්වයන් වැඩිදියුණු කිරීමයි. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12,003.53 කට සමාන එජඩො මිලියන 109.12 ක් වන අතර, ඉන් රු.මිලියන 10,380.70 කට සමාන එජඩො මිලියන 94.37 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. 2010 අප්‍රේල් 09 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර, 2014 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2017 ජුනි 30 දක්වා දීර්ඝ කරන ලදී.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි· කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සළකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන්න.

(ඇ) ශ්‍රී ලංකා රජය හ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව,

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව,

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව,

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව,

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(ඒ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැළපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවරක් ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

(අ) විද්‍යාගාර උපකරණ මිලදී ගැනීම සඳහා අත්තිකාරම් ලෙස ගෙවා තිබූ රු. මිලියන 1.23 ක මුදල ප්‍රාග්ධනිත කර ව්‍යාපෘතියේ ජංගම නොවන වත්කම් ලෙස දක්වා තිබුණි.

(ආ) පාරිසරික විද්‍යාගාරය ඉදිකිරීම වෙනුවෙන් වර්ෂය තුළ රු.මිලියන 5.23 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා එය ප්‍රාග්ධනිත කර තිබුණද 2015 දෙසැම්බර් 31 දින වන විටත් පාරිසරික විද්‍යාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම් වැඩ නිම කර නොතිබුණි.

#### 2.2.2 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 21 වන වගන්තිය හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුවන් 04 කට 2014 ජුනි මාසයේ සිට 2015 ඔක්තෝබර් මාසය දක්වා කාල සීමාව තුළ එකතු කළ අගය මත බදු සඳහා කළ රු.මිලියන 40.24 ක ගෙවීම් සම්බන්ධ තොරතුරු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන සහ සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කීපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම්වල මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | 2015 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2015 වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසබැ | 94.37 | 10,380.70 | 2,778.98 | 19.87 | 2,778.98 | 36.98 | 4,878.00 |
| ශ්‍රීලංර | 14.75 | 1,622.83 | 294.23 | 2.06 | 288.80 | 5.38 | 709.53 |
| එකතුව | **109.12** | **12,003.53** | **3,073.21** | **21.93** | **3,067.78** | **42.36** | **5,587.53** |

ඉහත සඳහන් තොරතුරු අනුව, ව්‍යාපෘති ක්‍රියාකාරකම් ආරම්භ වී වර්ෂ 5 1/2 ක් ඉක්මවා තිබියදීත් වෙන් කරන ලද ප්‍රතිපාදන එජඩො මිලියන 109.12 ක මුදලින් රු. මිලියන 12,003.53 න් 2015 දෙසැම්බර් 31 දිනට සියයට 39 ක් නියෝජනය වූ එජඩො මිලියන 42.36 කට සමාන රු.මිලියන 5,587.53 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ව්‍යාපෘති ක්‍රියාකාරකම් ආරම්භයේ සිටම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ විස්තරාත්මක සැලසුමක් නොතිබීම හේතුවෙන් ඉතිරි වර්ෂ 1 1/2 තුළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා සමස්ථ අරමුදල් ප්‍රතිපාදන උපයෝජනය ගැටළු සහගත විය හැක.

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය මගින් මහ කොළඹ ප්‍රදේශය තුළ අභ්‍යන්තර ජලයේ ස්වසථතා හා සනීපාරක්ෂක තත්ත්වය වැඩි දියුණු කිරීමේ අරමුණින් අප ජල කළමනාකරණය සඳහා මලාපවහන නළ, පිට කිරීම් මුව (Ocean Outfall) සහ පොම්පාගාර වැඩි දියුණු කිරීම වැනි ක්‍රියාමාර්ග ගෙන තිබුණි. කෙසේ වුවත් ව්‍යාපෘතිය මගින් කොළඹ මහා නගර සභා බල ප්‍රදේශය තුළ පරිසර දූෂණ ප්‍රභවයන් සහ ඒ සඳහා වග කිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීමට ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි. එබැවින් පාසල් සිසුන් හා පැල්පත් වාසීන් ඉලක්ක කොට දැනුවත් කිරීමේ වැඩසටහන් සහ සේවා නියුක්තිකයන් හා වෙනත් අවශ්‍යතා සඳහා ග්‍රාමීය ප්‍රදේශ වල සිට කොළඹ නගරයට දිනපතා පැමිණෙන පුද්ගලයන් කසළ කළමනාකරණය සම්බන්ධයෙන් ප්‍රමාණාත්මකව දැනුවත් කර නොතිබුණි.

ඊට අමතරව, ව්‍යාපෘතිය විසින් ඉදිකළ මනුවලවල් තුළ අපද්‍රව්‍ය තැන්පත් වීම හේතුවෙන් මල නාලිකා අවහිර වී ඇති බව විගණන නිළධාරීන් සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර එම අපද්‍රව්‍ය බැහැර කිරීමට කාර්යක්ෂම ක්‍රමවේදයන් අනුගමනය කර නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

----------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) කොළඹ මහා නගර සහා බල ප්‍රදේශය තුළ තෝරාගත් කිලෝමීටර් 10 ක අපජල නළ අළුත්වැඩියාව සහ කිලෝමීටර් 125 ක අපජල නළ තත්ත්ව පරීක්ෂාව සම්බන්ධ කොන්ත්‍රාත්තුව 2014 ජුනි 02 දින පිරිනමා තිබු අතර 2016 දෙසැම්බර් 20 දින අවසන් කිරීමට එකඟ වී තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකළ විස්තරාත්මක විගණනයේදී පහත කරුණු අනාවරණය විය.

(i) මළ නාලිකා ඇතිරීම සඳහා මිලදී ගත් මැටි පයිප්ප වල සම්පිඩක ශක්තිය 75 N / mm ප්‍රමාණයේ තිබිය යුතු වුවත් 2016 පෙබරවාරි 19 දින නගර සහා ඉංජිනේරුවන් සිදුකළ තත්ත්ව පරීක්ෂාවේදී එය 33.44 N / mm සිට 64.46 N / mm දක්වා වු අඩු පරාසයක තිබු බව අනාවරණය වු අතර සම්පිඩක ශක්තිය අඩු මැටි පයිප්ප 1020 ක් අතුරා තිබුණි.

(ii) පරිවය අනුව, මනු වලවල් තුළ තැන්පත් වන අපද්‍රව්‍ය කාර්යක්ෂමව ඉවත් කිරීම සඳහා "සිල්ක් සකර්" නමැති යන්ත්‍රය භාවිතා කළ යුතු වුවත් කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කාලපරිඡේදය තුළ එම යන්ත්‍රය භාවිතා නොකොට මිනිස් ශ්‍රමය භාවිතා කර අපද්‍රව්‍ය ඉවත් කර තිබුණි.

(iii) මල නාලිකා එළීමේදී ඉඩදෙන මට්ටම (Tolerance Level) පරීක්ෂා කිරීම සහ වාර්තා කිරීම පිළිගත හැකි මට්ටමේ නොවන පරිවයක් වන අතින් සිදුකරන බව විගණන නිළධාරීන් සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය වු අතර කොන්ත්‍රාත් සමාගම විසින් අතුරන මළ නාලිකා වල ඉඩදිය හැකි මට්ටම පරීක්ෂා කිරීමට නවීන තාක්ෂණය භාවිතා කර නොතිබුණි.

(ආ) විද්‍යාගාර උපකරණ මාස 03 ක් ඇතුළත මිලදී ගැනීම සඳහා වු කොන්ත්‍රාත්තුව වෙනුවෙන් 2015 ඔක්තෝබර් 29 දින බාහිර පාර්ශවයකට රු.මිලියන 1.23 ක අත්තිකාරම් ගෙවා තිබුණද 2016 අප්‍රේල් 30 දින වන විටත් අදාල උපකරණ සපයා නොතිබුණි.

(ඇ) සමස්ථ ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම හේතුකොට ගෙන පෙලන්ගස්තුඩුව ජල නල මාර්ගයේ 225 mm පයිප්ප ඇතිරීම සම්බන්ධ ඉදිකිරීම් වැඩ හා මනුවල වලවල් 10 ක් ඉදිකිරීම සම්බන්ධ කාර්යයන් ව්‍යාපෘති විෂය පථයෙන් ඉවත් කර තිබුණි.

(ඈ) කොන්ත්‍රාත් ගිවිසුමේ 8.2 ඡේදය ප්‍රකාරව වනාතමුල්ල භූගත මළ නාලිකා පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 2014 ජනවාරි 13 ප්‍රදානය කර තිබුණු අතර 2015 ජනවාරි 13 ට පෙර නිම කිරීමට අපේක්ෂිතව තිබුණද 2015 දෙසැම්බර් 31 දින වන විටත් එම වැඩිදියුණු කිරීමේ කාර්යයන් නිම කර නොතිබුණි. තවද, කොන්ත්‍රාත් ගිවිසුමේ 8.4 හා 20.1 කොන්දේසි ප්‍රකාරව ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමට ද පියවර ගෙන නොතිබුණි.

(ඉ) මාදම්පිටිය පාරසරික විද්‍යාගාරය ඉදිකිරීම් වැඩ 2015 මැයි 01 දින අවසන් කිරීමට අපේක්ෂිත වුවත් අදාල කොන්ත්‍රාත්තුව මාස 10 කින් ප්‍රමාද වී තිබු අතර 2016 මාර්තු 02 වන විටත් අවසන් කර නොතිබුණි. ඉදිකිරීම් කටයුතු කඩිනමින් කිරීමට ව්‍යාපෘතිය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.